# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2104/6 - 2018 දෙසැම්බර් මස 31 වැනි සඳුදා - 2018.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

ජනාධිපතිවරයා විසින් නියම කරන ලද පරිදි 1979 අගෝස්තු මස 06 වැනි දින අංක 48/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ සහ කලින් කල සංශෝධිත, ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය, 2018.10.26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, තව දුරටත් පහත උපලේඛනයෙහි සඳහන් ලෙසින් සංශෝධනය කිරීමට අතිගරු ජනාධිපතිතුමා නියම කර ඇති බව මෙයින් නිවෙදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

2018 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

1. ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 4 වැනි ව්‍යවස්ථාවට ඉක්බිතිව පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලැබේ.

4 (අ) තම පාලනයෙන් බැහැර හේතුවක් මත එනම්, "විනය කරුණක් නොවන හේතුවක්, අමාත්‍ය මණ්ඩල සංශෝධනයක් හෝ පාර්ලිමේන්තුව හෝ අමාත්‍ය මණ්ඩලය විසිරීමක් හේතුවෙන්" තනතුරු අහිමි වන ලේකම්වරයකු එම ධුරය අහිමි වන දිනට අමාත්‍යාංශ ලේකම් ධුරයෙහි අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විට,

(i) අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීම දක්වා වූ ඉතිරි සේවා කාලය, වසරක් හෝ ඊට වඩා අඩුවන්නේ නම්, එවැනි නිලධාරියකු ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාවේ (4) වැනි ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන පරිදි සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවකදී වයස අවුරුදු 60 දක්වා සේවයේ සිටියා සේ උපකල්පනය කොට, විශ්‍රාම වැටුප් හා අනෙකුත් සියලු දීමනා හා වරප්‍රසාද හිමි ගැන්වීම.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාවේ (5) වන ව්‍යවස්ථාව පරිදි තමා කලින් නියුක්තව සිටි සේවයට නැතහොත් ධූරයට නැවත පත්වන්නේ නම්, ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාවේ 5 (අ) ව්‍යවස්ථාව අනුව රඳවා ගත හැකි ජ්‍යෙෂ්ඨතාවය, වැටුප් පරිමාණය සහ ඊට අමතරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2018.05.23 දිනැති අංක පීඑස්/සීඑස්ජ්/00/1/9/11 දරන ජනාධිපති කාර්යාලීය චක්‍රලේඛය මගින් අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා ලබාදුන් විශ්‍රාම වැටුප් සහිත විශේෂ දීමනාව ද හිමි ගැන්වීම.

01 - 300

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.